**ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විගණකාධිපති වාර්තාව**
**2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගණුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 329 -තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 13 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. කාර්යභාරයන් ඉටුනොකිරීම. | 2.1.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.5 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.2 |
| | | 4. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.6 |
| | | 5. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.8 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියාමනයන් තම දෙපාර්මේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.7 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. අවිධිමත් ගනුදෙනු<br>2. බැඳීම් හා බැරකම් | 2.4<br>2.3 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**------------------------------------------------------**

**2.1 කාර්යසාධනය**

**--------------------**

**කාර්යභාරයන් ඉටුනොකිරීම**

**-----------------------------------**

(අ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ සූදානම

----------------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

මේ හේතුවෙන් තම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක වෙත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයක්ද හඳුනාගැනීමට දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

------------------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 10 ක් ඉටුකළ යුතුව තිබුණද එම කාර්යයන්වලින් කිසිවක් සම්පූර්ණයෙන්ම අවසන් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව, භාෂා ත්‍රිත්වයෙන් චක්‍රලේඛ, ගැසට් නිවේදන, ප්‍රවෘත්ති හා විවිධ වාර්තා ඇතුලත් කර වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබුණද, වෙබ් අඩවිය එසේ යාවත්කාලීන කර නොතිබුණි.

(ii) ආර්ථික විචලනයන්ට අනුව දෙපාර්තමේන්තු Apps සංවර්ධනය කළයුතු බවට සැලසුම් කර තිබුණු අතර මූලික පරීක්ෂාවක් වශයෙන් “Leave App” සකස් කර තිබුණි. එහි පරීක්ෂණ තත්වයන් හා සාර්ථකත්වය අනුව Apps සංවර්ධනය ඉදිරියට ගෙන යාමට තීරණය කර තිබුණද, ප්‍රමාණවත් දැනුම නොමැතිවීම හේතුවෙන් එය අතහැර දමා තිබුණි.

(iii) සියළුම නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් මානව සම්පත් තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ආරම්භක තත්ත්වයේ පමණක් පැවතුණි.

(iv) නැවත නිර්මාණය හා ස්වයංක්‍රීයව පිරිවැය පාලනය වන අයුරින් දෘඩාංග නඩත්තු කිරීමටත් ඒ මඟින් අභ්‍යන්තර කටයුතු ස්වයංක්‍රීයකරණයට ලක් කර ලිපිද්‍රව්‍ය පිරිවැය පාලනය කිරීමටත් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ඇතැම් දෙපාර්තමේන්තු සඳහා පමණක් මෙම දෙපාර්තමේන්තුව මඟින් ගොඩනගන ලද ලේඛන කළමණාකරන පද්ධතියක් හඳුන්වා දී තිබීම හේතුවෙන් එම අරමුණ ඉටු වී නොතිබුණි.

(v) රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියට අදාළව ITMIS මෘදුකාංග වැඩිදියුණු කිරීමේ කටයුතු සහ දෘඩාංග සැපයීමේ කටයුතු 2018 නිම වී ඇති බවට වාර්තා වී ඇතත් අගෝස්තු 13 දිනය වන විටත් එම මෘදුකාංග ක්‍රියාත්මක මට්ටමේ නොපැවතුණි.

(vi) අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්මේන්තුවලට නව ඊ වැටුප් පද්ධතිය හඳුන්වාදීම දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වුවද 2018 ජුලි 19 දින වන විටත් එම පද්ධතිය හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(vii) රජයේ නිලධාරීන්ට පහසුවෙන් හා නිරවද්‍යව පඩිනඩි ගෙවීම සඳහා Payroll පද්ධතිය වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබුණද, එය 2018 ජුලි 19 දින වනවිටත් ක්‍රියාත්මකව නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවා ලබා ගැනීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඒ අනුව මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය අනුව, වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී සැපයුම්කරුවන් තෝරා ගැනීම SLT Rainbow Pages යනාදිය අනුව සිදු කළ යුතු වුවත්, ලිපිද්‍රව්‍ය වැනි ඇතැම් මිලදී ගැනීම්වලදී එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව, ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් විධිමත් පරිදි සිදු කර නොතිබීම හේතුවෙන් එකම අයිතමය වැඩි මිල ගණන් යටතේ මිලදී ගැනීමට සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

**2.3 බැඳීම් හා බැරකම්**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 94 (i) අනුව බැඳීම ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන්වල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වුවද, එවැනි තහවුරු කර ගැනීමකින් තොරව රු. 81,899 ක බැරකම්වලට බැඳී තිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය, සාමූහිකත්වය හා ආකල්ප වර්ධනය කිරීම සඳහා බාහිර පුහුණු වැඩමුළුවක් පවත්වා තිබූ අතර ඒ සඳහා රු.447,560 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) මෙම වැඩමුළුව 2017 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) වැඩමුළුව සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 40 දෙනෙකු සහභාගී කරවීමට සැලැසුම් කළද 25 දෙනෙකු පමණක් සහභාගී වී තිබුණු අතර දෙපාර්තමේන්තු නොවන නිලධාරීන්ද සහභාගී වී තිබුණි.

(ආ) අදාල වැඩය හෝ සේවා සම්පූර්ණ කර නොගෙන මුදල් රෙගුලාසි 137, 138 හා 139 හි විධිවිධානවලට පටහැනිව රු.18,722 ක චෙක්පතක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 28 දින නිකුත් කර තිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 04 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා සමාලෝචිත වර්ෂයේ තොරතුරුවලට අදාළ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදමේ ස්වභාවය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිවීම | ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2014 | පුනරාවර්තන | 101.8 | 100.9 | 0.9 | 1 |
| | මූලධන | 5.8 | 1.1 | 4.7 | 82 |
| | **එකතුව** | **107.6** | **102** | **5.6** | **5** |

]

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 62.37 | 61.78 | 0.59 | 0.95 |
| | මූලධන | 4.61 | 4.60 | 0.01 | 0.22 |
| | **එකතුව** | **66.98** | **66.38** | **0.60** | **0.90** |
| 2016 | පුනරාවර්තන | 37.16 | 28.65 | 8.51 | 22.90 |
| | මූලධන | 2.24 | 2.15 | 0.09 | 4.02 |
| | **එකතුව** | **39.4** | **30.8** | **8.59** | **21.83** |
| 2017 | පුනරාවර්තන | 39.34 | 29.13 | 10.21 | 25.95 |
| | මූලධන | 7.10 | 2.89 | 4.21 | 59.25 |
| | **එකතුව** | **46.44** | **32.02** | **14.42** | **31.05** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු. 50,000 ම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 4 ක් සඳහා එකතුව රු.652,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්වලින් ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.351,867 ක් වී තිබුණි. ඒ අනුව, වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 76 දක්වා පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.6,500,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වලින් ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.4,093,808 ක් වී තිබුණි. ඒ අනුව වැය විෂයයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.6 අග්‍රිම ගිණුම

2017 ජනවාරි 09 දිනැති අංක TO/BE1/2/IMP/329/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ අක්මුදල් සීමාව තීරණය කිරීම යන සඳහා වූ ලිපිය අනුව, මාසික අක්මුදල් සීමාව, කාර්තුවකට වරක් සමාලෝචනය කර සත්‍ය තොරතුරු වාර්තා කරමින් අක්මුදල් සීමාවන් නිශ්චය කරවා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 24.03 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල පඩිනඩි වියදම රු. 801,143 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 05 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 04 | 03 |
| (iii) | ද්විතික මට්ටම | 19 | 14 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 05 | 03 |
| (v) | කොන්ත්‍රාත් | 02 | 02 | - |
| | එකතුව | 45 | 30 | 15 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, විද්‍යා හා තාක්ෂණ නිලධාරි තනතුර සඳහා නිලධාරියෙකු පත් කර තිබුණු නමුත් එම තනතුර අනුමත තනතුරක් නොවුණි.

(ii) ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධති (ITMIS) ව්‍යාපෘතිය හා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධති (RAMIS) ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2013 වර්ෂයේ සිට යටිතල පහසුකම් සංවර්ධන ජ්‍යෙෂ්ඨ විශේෂඥ හා තොරතුරු තාක්ෂණ ජ්‍යෙෂ්ඨ විශේෂඥ තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ මත කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් දෙදෙනෙකු පත් කර තිබුණි. එසේ වුවද, ITMIS ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 20 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බව නිරීක්ෂණය විය. එසේ තිබියදීත් මෙයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ITMIS හා RAMIS ව්‍යාපෘති 2016 දෙසැම්බර් වන විටත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පැවති බව වාර්තා කර තිබුණි. මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ද යාවත්කාලීන කර නොතිබුණි.

(iii) 2017 පෙබරවාරි 28 දිනැති අංක 04/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා 05 දෙනෙකු යෙදවිය හැකි වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට පුහුණු අභ්‍යාසලාභීන් 25 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. එසේම ඇතැම් අවස්ථාවලදී පුහුණු අභ්‍යාසලාභීන්ගේ සේවා කාලය වරින් වර දීර්ඝ කිරීමක්ද සිදු කර තිබුණි.

(iv) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් I ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරක් අනුමත කර ඇතත් මෙම පුරප්පාඩුව 2018 සැප්තැම්බර් 20 වන දින වන විටත් සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.